ජංගම/මාර්ගගත බැංකු සේවය - නියම හා කොන්දේසි

1. අර්ථනිරූපන:-

1.1 "ගිණුම/ගිණුම්" යන්නෙන් ජංගම බැංකු සේවාව සහ/ මාර්ගගත බැංකු සේවාව භාවිතය මගින් පවත්වාගෙන යාම සඳහා සුදුසුකම්ලත් ගනුදෙනුකරුගේ බැංකු ගිණුම/ගිණුම් සහ/හෝ ක්‍රෙඩිට් කාඩ් ගිණුම සහ/හෝ වෙනත් වර්ගයේ ගිණුමක්/ගිණුම් අදහස් වේ.

1.2 "බැංකුව" යන්නෙන් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය සහ එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් අදහස් වේ.

1.3 "ජංගම බැංකු සේවාව" යන්නෙන් බැංකුව විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි යම් ජංගම උපාංගයක් හරහා පරිශීලක නාමයක් සහ මුරපදයක් භාවිත කරමින් බැංකු ගනුදෙනු සැබෑ බවට සහතික කිරීම හෝ බැංකු ගනුදෙනු සිදු කිරීම අදහස් වේ. මෙම සේවාවට NEOS Pay පහසුකම සහ NEOS ගිණුම් විවෘත කිරීමේ පහසුකම ඇතුළත් වේ.

1.4 "ජංගම බැංකු සේවා යෙදුම" යන්නෙන් ජංගම උපාංගයක් මගින් ගනුදෙනු සිදුකිරීමේ කාර්යය සඳහා බැංකුව විසින් ලබාදී ඇති යෙදුමක් අදහස් වේ.

1.5 "ජීවදත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුමට ප්‍රවේශවීමේ සේවාව" යන්නෙන් බැංකුවේ ජංගම බැංකු සේවා යෙදුමට ප්‍රවේශවීම සඳහා ගනුදෙනුකරුගේ අනන්‍යතාවය තහවුරු කරගැනීමට බැංකුව විසින් උත්පාදනය කරනු ලබන මාර්ගගත/ ජංගම බැංකු සේවා මුරපදය වෙනුවට ආරක්ෂණ කේතයක් වශයෙන් අවසරලත් ජංගම උපාංගයක ලියාපදිංචි කරන ලද ගනුදෙනුකරුගේ මුහුණ හඳුනාගැනීම හෝ ඇඟිලි සළකුණ ගනුදෙනුකරුට යොදාගැනීමට හැකියාව ඇති සේවාවක් අදහස් වේ.

1.6 "NEOS Pay පහසුකම" යන්නෙන් ජංගම බැංකු සේවා යෙදුමෙහි ලියාපදිංචිවීම මගින් Just Pay පහසුකම හරහා වෙළඳ ගෙවීම් සිදුකිරීමට ගනුදෙනුකරුවන් විසින් භාවිත කළ හැකි QR කේත පදනම් කරගත් ගෙවීමේ මාර්ගයක් අදහස් වේ.

1.7 "මාර්ගගත බැංකු සේවය" යන්නෙන් https://www.neosonline.ndbbank.com යන වෙබ් ලිපිනය මගින් වෙබ් බ්‍රවුසරයක් හරහා බැංකු ගනුදෙනුවල නිරතවීම අදහස් වේ.

1.8 "NEOS ගිණුම් විවෘත කිරීමේ පහසුකම" යන්නෙන් බැංකුවේ ජංගම සේවා යෙදුම හෝ මාර්ගගත බැංකු සේවාව හරහා ගනුදෙනුකරුවන්ගෙන් ලද ඉල්ලීම් මත පදනම්ව බැංකුව විසින් කලින් කල අවසර ලබාදෙන ස්ථාවර තැන්පතු ගිණුම් සහ වෙනත් ගිණුම් විවෘත කිරීම අදහස් වේ.

1.9 "ජීව දත්ත (Biometrics)" යන්නෙන් ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවා යෙදුම වෙත පිවිසෙන අවස්ථාවේ දී ඔහුගේ/ඇයගේ තේරීම අනුව ඒ සඳහා භාවිත කළ හැකි මුහුණු අනන්‍යතාවය හෝ ඇඟිලි සළකුණු අනන්‍යතාවය අදහස් වේ.

1.10 "ගනුදෙනුකරු" යන්නෙන් ගනුදෙනු කිරීම සඳහා බැංකුව විසින් සපයා ඇති ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව භාවිත කරනු ලබන තනි පුද්ගලයකු අදහස් වේ.

1.11 "Just Pay පහසුකම" යන්නෙන් ගනුදෙනුකරුවන්ගේ ජංගම හෝ ඉතිරිකිරීමේ ගිණුමකින් වෙළෙන්දෙකුගේ ගිණුමකට සෘජුව මුදල් හුවමාරු කිරීම මගින් ස්මාර්ට් ජංගම උපාංග භාවිතයෙන් සිල්ලර ගෙවීම් කිරීමට ගනුදෙනුකරුවන්ට පහසුකම් සපයන්නා වූ LankaPayහි පවත්නා ගෙවීම් පහසුකමක් අදහස් වේ.

1.12 " LankaPay" යන්නෙන් ශ්‍රී ලංකා මහබැංකුව විසින් මෙහෙයවනු ලබන ශ්‍රී ලංකාවේ ජාතික ගෙවීම් ජාලය අදහස් වේ.

1.13 "වෙළෙන්දා" යන්නෙන් ව්‍යාපාරවල හෝ වෙළඳාමේ නිරත වී සිටින යම් තැනැත්තකු අදහස් වේ.

1.14 "OTP" යන්නෙන් බැංකුව විසින් උත්පාදනය කරනු ලබන එක් වරක් පමණක් භාවිත කළ හැකි මුර පදයක් අදහස් වේ.

1.15 "මුරපදය" යන්නෙන් ලියාපදිංචි වන අවස්ථාවේ දී ගනුදෙනුකරු විසින් මුලින් ඇතුලත් කරනු ලබන හෝ ගනුදෙනුකරු විසින් පසුව සකස් කරනු ලබන මුරපදය අදහස් වේ.

1.16 "යම් තැනැත්තකුට ගෙවීම" යන්නෙන් ගිණුම් අංකය වෙනුවට අර්ථලාභියාගේ ලියාපදිංචි ජංගම දුරකතන අංකය ඇතුළත් කිරීම මගින් හෝ අර්ථලාභියාගේ QR කේතය පරිලෝකනය කිරීම මගින් ගනුදෙනුකරුවකු විසින් වෙනත් ගනුදෙනුකරුවකුට ගිණුම් අතර මුදල් හුවමාරු කිරීම සඳහා ජංගම බැංකු සේවා යෙදුමේ හෝ මාර්ගගත බැංකු සේවය හරහා සපයන ලද කාර්යයක් අදහස් වේ.

1.17 ජංගම "දුරකතන අංකයට ගෙවීම" යන්නෙන් ගිණුම් අංකය වෙනුවට අර්ථලාභියාගේ ලියාපදිංචි ජංගම දුරකතන අංකය ඇතුලත් කිරීම මගින් ගනුදෙනුකරුවකු විසින් වෙනත් ගනුදෙනුකරුවකුට ගිණුම් අතර මුදල් හුවමරු කිරීම සඳහා මාර්ගගත බැංකු සේවයෙහි සපයන ලද කාර්යයක් අදහස් වේ.

1.18 "QR කේතය" යන්නෙන් ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ කේතය අදහස් වේ.

1.19 "අහඹු අංකය" යන්නෙන් ගනුදෙනුකරුවකු වෙනත් මූල්‍ය ආයතනයක ලියාපදිංචි වී ඇති අංකයට එම වෙනත් මූල්‍ය ආයතනය විසින් යවනු ලබන SMS පණිවුඩයක් (කෙටි පණිවුඩයක්) මගින් සම්ප්‍රේෂණය කරනු ලබන අහඹු මූල්‍ය අගයක් අදහස් වන අතර එය NEOS Pay පහසුකම සඳහා ජංගම බැංකු සේවා යෙදුමෙහි ලියාපදිංචිවීමේ කාර්යය සඳහා ගනුදෙනුකරු තහවුරු කරගැනීම සඳහා භාවිත කරනු ලැබේ.

1.20 "සේවා සැපයුම්කරු" යන්නෙන් විදුලි සංදේශ සැපයුම්කරුවන්, රක්ෂණ සමාගම්, ජල සැපයුම් සමාගම් සහ විදුලි සැපයුම් සමාගම් වැනි යම් තුන්වන පාර්ශ්වයේ උපයෝගීතා සැපයුම්කරුවකු අදහස් වේ.

1.21 "පරිශීලක අනන්‍යතාවය" යන්නෙන් ගනුදෙනුකරුගේ විශේෂ පරිශීලක හඳුනාගැනීම අදහස් වේ.

2. ලියාපදිංචි කිරීම

2.1 ගනුදෙනුකරුගේ ජංගම උපාංගයෙන් ඔහු/ඇය විසින් ජංගම බැංකු සේවා යෙදුම බාගත කිරීමෙන් පසුව හෝ වෙබ් බ්‍රවුසරයක් මගින් මාර්ගගත බැංකු සේවා වෙබ් ලිපිනයට ප්‍රවේශ වීම මගින් ගනුදෙනුකරුට පහත දැක්වෙන ක්‍රම අතරින් එකකට ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව සඳහා ලියාපදිංචි විය හැකි ය. දැනට පවත්නා ව්‍යවස්ථාපිත නියමයන් ප්‍රකාරව ජංගම බැංකු සේවා යෙදුම බාගත කර ක්‍රියාත්මක කිරීමට භාවිත කරන ලද ජංගම උපාංගයේ විස්තර ජංගම බැංකු සේවා යෙදුම භාවිත කිරීම සඳහා ගනුදෙනුකරුගේ ප්‍රොෆයිලය හෝ පරිශීලක අනන්‍යතාවය යටතේ ස්වයංක්‍රීයව ලියාපදිංචි විය යුතු බවට ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගෙන සිටිනු ලැබේ. එසේ ම ජංගම බැංකු සේවා යෙදුම ලියාපදිංචි නොකළ ජංගම උපාංගයකින් භාවිත කළ නොහැකි ය. එබැවින්,

(i) ණය කාඩ්පත්/ ක්‍රෙඩිට් කාඩ්පත් විස්තර සහ PIN අංකය ඇතුළත් කිරීම මගින්,

(ii) බාගත කරන ලද ජංගම බැංකු සේවා යෙදුමෙහි Just Pay සඳහා ඉඩ ලබා දී ඇති බැංකුවක හෝ වෙනත් මූල්‍ය ආයතනයක යන කවර ස්ථානයක හෝ පවත්වාගෙන යන ගනුදෙනුකරුගේ තෝරාගත් යම් ගිණුමක ගිණුම් අංකය ඇතුළත් කිරීම මගින්,

ගනුදෙනුකරුවකුට ජංගම බැංකු සේවාව සඳහා ලියාපදිංචි වියහැකි ය. OTP අංකයක් බැංකු ගනුදෙනුකරුගේ ජංගම දුරකතන අංකයට උත්පාදන වන අතර වෙනත් මූල්‍ය ආයතනයක ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් වන විට දී අහඹු අංකයක් උත්පාදනය වීම සිදු වේ. ඉහත සඳහන් OTP අංකය හෝ අහඹු අංකය ඇතුළත් කිරීමෙන් පසුව ගනුදෙනුකරුට ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව සඳහා ලියාපදිංචි විය හැකි ය. (සැකදුරුකිරීම සඳහා බැංකුවේ ලියාපදිංචි කරන ලද ජංගම දුරකතන අංකයට ඉහත සඳහන් OTP අංකය උත්පාදනය වන අතර වෙනත් මූල්‍ය ආයතවල පවත්වාගෙන යනු ලබන ගිණුම් සඳහා අහඹු අංකය උත්පාදනය වේ.)

ගනුදෙනුකරු විසින් වෙනත් මූල්‍ය ආයතනවල පවත්වාගෙන යනු ලබන ගිණුම් සඳහා ලියාපදිංචිවීමට අහඹු අංකය නිවැරදිව ඇතුළත් කිරීම සම්බන්ධයෙන් තමා වගකිවයුතු බවට ගනුදෙනුකරු එකඟව සිටී.

3. ජංගම බැංකු සේවාව මගින් සිදුවන ගනුදෙනු සඳහා වන උපදෙස් සහ පණිවුඩ

3.1 ජංගම බැංකු සේවා යෙදුමට පිවිසීම මුරපදය ඇතුළත් කිරීම හෝ ජීව දත්ත ක්‍රමය යන කවර ආකාරයෙන් හෝ කිරීමට අවසර ඇති අතර එම පිවිසීමේ ක්‍රමය ගනුදෙනුකරු විසින් ඔහුගේ/ඇයගේ අභිමතය පරිදි තීරණය කරනු ලැබිය හැකි ය. පරිශීලක අනන්‍යතාව සහ මුරපදය ඇතුළත් කිරීම හරහා මාර්ගගත බැංකු සේවාව වෙත පිවිසීමට අවසර ඇත.

3.2 ජංගම බැංකු සේවය සහ/හෝ මාර්ගගත බැංකු සේවය හරහා ගනුදෙනුකරුගෙන් පැමිණෙනු ඇති බවට සැලකෙන සහ බැංකුව වෙත ලැබෙන සියලු උපදෙස් හෝ පණිවුඩ පිලිගැනීමට හෝ ඒ අනුව කටයුතු කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

3.3 ගනුදෙනුවක් සිදුකිරීම සඳහා අවශ්‍ය වන ගනුදෙනුකරුගේ විස්තර යම් තුන්වන පාර්ශ්වයේ සේවා සැපයුම්කරුවකු සමඟ බෙදා ගැනීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

3.4 බැංකුව විසින් කිසිදු අවස්ථාවක දී ගනුදෙනුකරුගේ පරිශීලක අනන්‍යතාව හෝ මුරපදය සන්නිවේදනය කිරීමට හෝ ඉල්ලා සිටීමට විද්‍යුත් පණිවුඩ හුවමාරු කිරීම භාවිත නොකරන බවට ගනුදෙනුකරු මෙයින් අවබෝධ කොටගෙන සිටියි.

3.5 ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව සඳහා ලියාපදිංචිවීම සහ ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව මගින් ගනුදෙනු කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් බැංකුව වෙත නිවැරදි සහ සම්පූර්ණ තොරතුරු සැපයීමට භාරගත යුතු ය. ගනුදෙනුකරුට දැනගැනීමට ලැබුණු යම් වරදක්, විෂමතාවක්, නොකර හැරීමක් පිළිබඳව ගනුදෙනුකරු විසින් බැංකුව වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය..

3.6 ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව හරහා හුවමාරු වන ඉලෙක්ට්‍රොනික පණිවුඩ ගනුදෙනුකරු සම්බන්ධයෙන් අවසානාත්මක සහ බන්ධනීය වන බවට ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය.

3.7 කවර ආකාරයකින් හෝ බලාත්මක කරන ලද ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව භාවිතයෙන් සිදු කරනු ලබන හෝ බලාත්මක කරනු ලබන සියලු ගනුදෙනු සම්බන්ධයෙන් පූර්ණ වගකීම ගනුදෙනුකරු විසින් භාරගනු ලැබිය යුතු ය.

3.8 ජංගම බැංකු සේවාව සහ/ හෝ මාර්ගගත බැංකු සේවාව සඳහා ලියාපදිංචිවීමේදී ගනුදෙනුකරු විසින් පවත්වාගෙන යනු ලබන සියලු ගිණුම් ජංගම බැංකු සේවා යෙදුමට සහ/හෝ මාර්ගගත බැංකු සේවාවට සම්බන්ධ වන බවට ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය. එසේ වුවද, ගනුදෙනුකරු බද්ධ ගිණුම්හිමියකු වන අවස්ථාවක බද්ධ ගිණුම් සම්බන්ධයෙන් වන විටදී "ඕනෑම අයෙකුට ප්‍රවේශ වීමට හැකි ය" ("anyone to sign") යන මෙහෙයුම් උපදෙස සහිත ගිණුම් සඳහා පමණක් ජංගම බැංකු සේවා සහ/ හෝ මාර්ගගත බැංකු සේවා මගින් ගනුදෙනු සිදුකරනු ලැබේ. වෙනත් වර්ගයක උපදෙස් සහිත බද්ධ ගිණුම්වල ශේෂය බැලීම පමණක් කළ හැකි ය.

3.9 ජංගම දුරකතන අංකයට ගෙවීමේ සහ/හෝ යම් තැනැත්තකුට ගෙවීමේ සේවා පැවතීමේ එකම අරමුණ සඳහා ගනුදෙනුකරු විසින් බැංකුවේ පවත්වාගෙන යන ඔහුගේ ගිණුම් අතරින් එක් ගිණුමක් ප්‍රාථමික ලැබීම් ගිණුම ලෙස නම් කළ යුතු ය. මෙම ප්‍රාථමික ගිණුම බැංකුවේ ලියාපදිංචි කරන ලද ගනුදෙනුකරුගේ ජංගම දුරකතන අංකයට සම්බන්ධ කළ යුතුය. එම ගිණුම ජංගම හෝ ඉතුරුම් බැංකු ගිණුමක් වුවහොත්, ජංගම දුරකතනයට ගෙවීම සහ/හෝ වෙනත් තැනැත්තකුට ගෙවීම හරහා ගනුදෙනුකරුට ලැබෙන සියලු ණය නම් කළ ප්‍රාථමික ගිණුමට, ස්වයංක්‍රීයව බැර කරනු ලැබිය යුතු ය. මෙහෙයුම් උපදෙස් අනුව නම් කළ ප්‍රාථමික ගිණුම වසා දමා හෝ අක්‍රීය වන හෝ නොපවතින අවස්ථාවකදී ගනුදෙනුකරුට දන්වා ඔහුගේ වෙනත් ගිණුම් වලින් යම් ගිණුමක් ප්‍රාථමික ගිණුම ලෙස නම් කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

3.10 පහත 6.1 වන වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ගනුදෙනුව සම්බන්ධයෙන් වන වෙනත් ගාස්තු ඇතුළත්ව ප්‍රමාණවත් මුදල් ගනුදෙනුකරුගේ ගිණුමේ හෝ ගිණුම්වල පවතීනම් මිස, ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව හරහා ගනුදෙනු කිරීමට උත්සාහ නොකළ යුතුය. ඉදිරි දිනයක දී සැලසුම් කර ඇති ගනුදෙනු අදාල දිනයේදී සහ අදාල වේලාවේදී එම ගිණුමේ හෝ ගිණුම්වල ප්‍රමාණවත් මුදල් ඇති නම් පමණක් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන බවට ගනුදෙනුකරු එකඟව සිටියි. ගනුදෙනුකරුගේ යම් ගෙවීම් උපදෙස් බැංකුවට ලැබෙන අවස්ථාවේදී හෝ එම ගෙවීම්

ගෙවනු ලැබිය යුතු අවස්ථාවේදී පහත 6.1 වන වගන්තිය යටතේ සඳහන් වෙනත් ගාස්තු සමග එකී උපදෙස් ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රමාණවත් මුදල් තිබේ නම් මිස එම උපදෙස් ක්‍රියාවට නැංවීමට බැංකුව වෙත කිසිදු බැඳීමක් නොමැති බවටද, එවැනි අවස්ථාවක දී ගෙවීම සිදු නොකිරීම පිළිබඳ දැන්වීම බැංකුව විසින් ගනුදෙනුකරු වෙත ලබාදීමට අවශ්‍ය නොවන බවටද ගනුදෙනුකරු විසින් තවදුරටත් එකඟව සිටිනු ලැබේ.

3.11 බැංකුවේ නිලධරයකු/නිලධරයන් විසින් බලය දීමක් සිදුකිරීමට අවශ්‍ය වන්නා වූ ගනුදෙනුකරුගේ ඉල්ලීම්/උපදෙස් වහාම හෝ ස්වයංක්‍රීයව බලාත්මක විය නොහැකි බවට ද ගනුදෙනුකරු වෙත දැන්වීමෙන් හෝ දැන්වීමකින් තොරව තම පරම අභිමතය මත එම උපදෙස් සඳහා අවසර ලබාදීම හෝ අවසර ලබානොදී සිටීම සඳහා වන අයිතිය බැංකුව විසින් රඳවාගන්නා බවට ද ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

3.12 පහත 6.1 වන වගන්තියේ සඳහන් ගිණුම/ගිණුම් බද්ධ ගිණුමක් වන අවස්ථාවකදී, ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව භාවිතයෙන් හටගන්නා වූ සියලු ගනුදෙනු සඳහා සැම ගිණුම්හිමියෙකු විසින්ම එක්ව හා වෙනුවෙන් වගකියනු ලැබිය යුතු ය.

3.13 ගනුදෙනුකරු වෙනුවට ගෙවීමක් සිදුකිරීමේ දී, බැංකුව, ගනුදෙනුකරුගේ නියෝජිතයකු වශයෙන් හෝ ගෙවීම ලබන්නා වූ තුන්වන පාර්ශ්වයේ නියෝජිතයකු වශයෙන් හෝ ක්‍රියා නොකරන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

3.14 කවර හෝ ක්‍රමයක් භාවිතයෙන්, ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව හරහා ගනුදෙනුකරු විසින් සිදු කරන ලද පරිශීලක ක්‍රියාකාරකම් සහ ගනුදෙනු පිළිබඳ සටහන් පවත්වාගෙන යාමට සහ යම් නිශ්චිත ගනුදෙනුවක්/ක්‍රියාකාරකමක් පරිශීලක අනන්‍යතාව (user ID) සහ මුරපදය භාවිතයෙන් සිදු කරන ලද බව තහවුරු කිරීමේ හෝ සත්‍යායනය කිරීමේ කාර්ය සඳහා එම වාර්තා භාවිත කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය පවරනු ලැබේ.

3.15 රතු නිවේදන ගෙවීම් පියවීම වැනි හදිසි ගෙවීම් පියවීම සඳහා ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව භාවිත කළ නොහැකි බවටත්, එවැනි හදිසි ගෙවීම්

පියවීම් බැංකු ශාඛාවක දී කළ යුතු බවටත් ගනුදෙනුකරු විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

3.16 සියලු කාර්ය සඳහා, ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව හරහා සිදුකරන ලද සියලු ගනුදෙනු පිළිබඳ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශ ගනුදෙනුකරු සම්බන්ධයෙන් අවසානාත්මක සහ බන්ධනීය වන බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය.

3.17 ප.ව. 8.00න් පසුව ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව හරහා හෝ වෙනත් මාර්ගයකින් සිදු කරනු ලබන ගනුදෙනුවල වලංගු දිනය එම ගනුදෙනුව සිදුකරනු ලබන දිනයම වුවද පසුව එළඹෙන දිනයේදී යාවත්කාලීන වන බව ගනුදෙනුකරු විසින් පිළිගනු ලැබිය යුතු ය.

4. ගනුදෙනුවල සුරක්ෂිතභාවය

4.1 ගනුදෙනුකරු විසින්, ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව භාවිත කිරීම සඳහා අවශ්‍ය යම් උපාංගයක ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව වෙත ඇතිවිය හැකි හානිකර තර්ජනවලට එරෙහි ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන සහිතව නිසි පරිදි ක්‍රියාකරන තත්ත්වයකින් සපයාගෙන පවත්වාගෙන යාමට එකඟව සිටිනු ලබන අතර ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව වෙත ප්‍රවේශ වීම සඳහා දෝෂ සහිත, අසම්පූර්ණ හෝ අනාරක්ෂිත උපාංග සහ/හෝ මෘදුකාංග භාවිත කිරීම හෝ ජංගම බැංකු සේවාව බැංකුව වෙත හානිදායක වන යම් ආකාරයකින් භාවිත කිරිම නොකර සිටීමට ගනුදෙනුකරු විසින් භාරගෙන සිටිනු ලැබේ.

4.2 ජීව දත්ත මගින් හෝ පරිශීලක අනන්‍යතාවයක් සහ මුරපදයක් භාවිතය යන කවර ආකාරයෙන් හෝ ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශවිය හැකිවීම පිළිබඳව තමා දැනුවත් වන බවට ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගෙන සිටිනු ලැබේ.

4.3 ජීව දත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශවීමට හැකියාව ලබාදීමෙන්, එම උපාංගයේම ජීව දත්ත ලියාපදිංචි කර ඇති යම් තුන්වන පාර්ශ්වයකට ද ජංගම බැංකු සේවා යෙදුම වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබාදෙන බවට ගනුදෙනුකරු විසින් තවදුරටත් එකඟව, ඒ බව අවබෝධ කරගෙන සිටිනු ලැබේ.

4.4 ජංගම බැංකු සේවා යෙදුම සහ/හෝ මාර්ගගත බැංකු සේවාව වෙත පළමුවරට ප්‍රවේශ වීමෙන් ඉක්බිතිවම සහ ක්‍රමානුකූල කාල අන්තරවලදී මුරපදය වෙනස් කිරීමට ගනුදෙනුකරු විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

4.5 ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව යම් අනවසර තැනැත්තකු/තැනැත්තන් වෙත නිරාවරණය වීමෙන් හෝ එවැනි තැනැත්තකු විසින් එම සේවාවන් වෙත ප්‍රවේශවීමෙන් හෝ එය භාවිත කිරීමෙන් ආරක්ෂා කරගැනීම සඳහා (ගනුදෙනුවලට අදාළ සියලු දත්ත සහ තොරතුරු ඇතුළුව) ගනුදෙනුකරු විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග සකස් කර පවත්වාගෙන යා යුතු ය.

4.6 කිසිවකු හෝ විසින් පරිශීලක අනන්‍යතාවය සහ මුරපදය අනවසරයෙන් භාවිත කිරීමක් හෝ භාවිත කිරීමට තැත් කිරීමක් පිළිබඳව හෝ යම් තුන්වන පාර්ශ්වයක ජීව දත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුම වෙත අනවසරයෙන් ප්‍රවේශවීමක් හෝ එසේ ප්‍රවේශවීමට තැත්කිරීමක් පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් වන්නේ නම්, ගනුදෙනුකරු විසින් වහාම ඒ පිළිබඳව බැංකුව වෙත දැනුම් දිය යුතු ය.

4.7 ජංගම බැංකු සේවා යෙදුමේ පරිශීලක අනන්‍යතාවය සහ මුරපදය දැඩි රහස්‍යභාවයකින් යුතුව තබා ගැනීමට සහ කිසිදු අවස්ථාවක දී කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ එය හෙළිදරව් නොකිරීමට හෝ කිසිදු තැනැත්තකුට එයට ප්‍රවේශවීමට කිසිදු ඉඩක් නොතැබීමට ගනුදෙනුකරු විසින් මෙයින් භාරගෙන සිටිනු ලැබේ.

5. ජීව දත්ත භාවිතය

5.1 ගනුදෙනුකරුගේ ජීවදත්ත උපාංගයේ ලියාපදිංචි කර ඇත්නම් පමණක් ජංගම බැංකු සේවා යෙදුම වෙත පිවිසීමට ජීවදත්ත භාවිත කිරීමට අවසර දෙනු ලබන බවට ගනුදෙනුකරු විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ. ඒ අනුව ජංගම උපාංගයේ ජීවදත්ත ලියාපදිංචි කර ඇති එකම තැනැත්තා ගනුදෙනුකරු පමණක් වන බවට ගනුදෙනුකරු විසින් සහතික කර ගත යුතුය.

5.2 ගනුදෙනුකරුගේ ජංගම උපාංගයේ ගබඩා කර ඇති ජීවදත්තමය තොරතුරු ඔහුගේම/ඇයගේම තොරතුරු වන බවටද, යම් තුන්වන පාර්ශවයක ජීවදත්ත ගනුදෙනුකරුගේ ජංගම උපාංගයේ ගබඩා කර නොමැති බවට ද, ගනුදෙනුකරු විසින් ජංගම

බැංකු සේවා යෙදුම වෙත පිවිසීම සඳහා ඔහුගේම/ඇයගේම ජීවදත්තමය තොරතුරු පමණක් භාවිත කළ යුතු බවටද ගනුදෙනුකරු විසින් සහතික කරගත යුතුය. ජංගම බැංකු සේවා යෙදුම සඳහා ලියාපදිංචි වූ උපාංගයේ තුන්වන පාර්ශ්වයක ජීවදත්ත ගබඩා කිරීම ආශ්‍රිතව ඇතිවන අවදානම් පිළිබඳව සහ ඒ හේතුවෙන් ගනුදෙනුවල සුරක්ෂිතභාවය අවදානමට ලක්විය හැකි වීම පිළිබඳව ගනුදෙනුකරු විසින් තවදුරටත් අවබෝධ කරගෙන පිළිගෙන සිටිනු ලැබේ.

5.3 ගනුදෙනුකරුට සර්වසම වූ සහෝදරයකු හෝ සහෝදරියක සිටින්නේ නම්, සත්‍ය බව සහතික කිරීමේ කාර්ය සඳහා ඔහු/ඇය විසින් මුහුණ හඳුනාගැනීමේ ක්‍රමය භාවිත නොකරන බවටත්, එවැනි අවස්ථාවලදී ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවා යෙදුම වෙත පිවිසීම සඳහා ජීවදත්ත වෙනුවට මුරපදයක් භාවිත කළ යුතු වන බවටත් ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

5.4 සත්‍ය බව සහතික කිරීමේ කාර්යය සඳහා ගනුදෙනුකරුගේ ජීවදත්තමය තොරතුරු භාවිත කිරීමේ සුරක්ෂිතභාවය අන්‍යාකාරයකින් අවදානමට ලක්විය හැකි ආකාරයේ ගනුදෙනුකරු විසින් ඔහුගේ ජංගම දුරකතනය මගින් සපයා දී ඇති යම් විශේෂාංගයක් අක්‍රීය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත යුතු බවට සහ/හෝ එහි යම් සැකසුම්වලට එකඟ විය යුතු බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ. (උදා: මුහුණ හඳුනාගැනීම සඳහා වන "attention-aware" යන විශේෂාංගය අක්‍රීය කිරීම)

5.5 ගනුදෙනුකරුගේ මුහුණ/ඇඟිලි සලකුණ හඳුනාගැනීමේ හෝ වෙනත් ආරක්ෂණ කේතයක සුරක්ෂිතභාවයට අවදානමක් ඇතිවී ඇති අවස්ථාවකදී, ගනුදෙනුකරු විසින් ඒ පිළිබඳව වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු අතර එවැනි අවස්ථාවක බැංකුව විසින් පරිශීලක අනන්‍යතාවය (User ID) අක්‍රීය කරනු ලැබේ. පරිශීලක අනන්‍යතාවය නැවත සක්‍රීය කර ගැනීමට ගනුදෙනුකරුට අවශ්‍ය වන්නේ නම්, ගනුදෙනුකරු විසින් ආසන්නතම බැංකු ශාඛාව වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

5.6 ජීවදත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුමට ප්‍රවේශවීමේ සේවාවේ කාර්යය සඳහා, ජංගම බැංකු සේවා යෙදුම විසින් ගනුදෙනුකරුගේ අවසරලත් ජංගම උපාංගයේ ලියාපදිංචි කර ඇති මුහුණු/ඇඟිලි සලකුණු හඳුනාගැනීම පරිශීලනය කරන බව ගනුදෙනුකරු විසින් පිළිගෙන ඊට එකගව සිටිනු ලබන අතර ජීව දත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුමට

ප්‍රවේශ වීමේ සේවාව සැපයීම සඳහා එම තොරතුරු බැංකුව විසින් පරිශීලනය කිරීම සහ භාවිත කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් සිය කැමැත්ත ලබා දිය යුතුය.

5.7 ගනුදෙනුකරුගේ අවසරලත් ජංගම උපාංගය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගනු ලබන අතර ජීවදත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුමට ප්‍රවේශ වීමේ සේවාවට ප්‍රවේශ වීම සඳහා (ගනුදෙනුකරු විසින් හෝ අන්‍යාකාරයකින් බලය පවරා තිබුණද) ගනුදෙනුකරුගේ අවසරලත් ජංගම උපාංගය භාවිත කරන සියලු ආකාරයන් සම්බන්ධයෙන් ගනුදෙනුකරු වගකිව යුතු වන්නේ ය.

5.8 ජංගම බැංකු සේවාවේ නියම හා කොන්දේසි වලට අමතරව සහ එහි වගකීමෙන් මිදීමේ ප්‍රකාශ සහ වගකීමෙන් බැහැර කිරීම් ඉවත් කිරීමෙන් තොරව, අවසරලත් ජංගම උපාංගයේ මුහුණු/ඇඟිලි සලකුණු සත්‍ය බව සහතික කිරීමේ මොඩියුලය බැංකුව විසින් සපයනු නොලබන බවට ද, යම් අවසරලත් ජංගම උපාංගයක මුහුණු/ඇඟිලි සලකුණු සත්‍ය බව සහතික කිරීමේ විශේෂාංගයේ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් සහ එය උපාංගයේ නිෂ්පාදකයා විසින් ඉදිරිපත් කරන ආකාරයට ක්‍රියා කරන්නේද යන්න සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු පෙනී සිටීමක් හෝ වගකීම දැරීමක් සිදු නොකරන බවටද ගනුදෙනුකරු විසින් මෙයින් පිළිගෙන සිටිනු ලැබේ.

5.9 ජීවදත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුමට ප්‍රවේශ වීමේ සේවාව සඳහා ප්‍රවේශ වීම සියලු අවස්ථාවන්හිදී යොදාගත හැකි බවට හෝ ඕනෑම ඉලෙක්ට්‍රොනික උපකරණයක්, මෘදුකාංගයක්, යටිතල පහසුකමක් හෝ බැංකුව විසින් කලින් කලට ලබා දෙන වෙනත් ඉලෙක්ට්‍රොනික බැංකු සේවාවන් සමඟ ක්‍රියාත්මක කළ හැකි බවට බැංකුව විසින් කියා සිටිනු හෝ වගකියනු නොලැබේ.

5.10 අදාළ නීති මඟින්, බැංකුව විසින් බැංකුවේ වගකීම බැහැර කිරීම හෝ සීමාකිරීම වළක්වනු ලබන්නේ නම් මිස, ජීවදත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුමට ප්‍රවේශ වීමේ සේවාව භාවිත කිරීම හෝ භාවිත කිරීමට තැත් කිරීම හෝ, ජීවදත්ත මගින් බැංකු සේවා යෙදුමට ප්‍රවේශ වීමේ සේවාව හරහා හෝ ඒ සම්බන්ධව ගනුදෙනුකරුගේ උපදෙස් හෝ සිදුවන යම් අනවසර ගනුදෙනු සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් දරනු ලබන යම් පාඩුවක් සඳහා බැංකුව වගකිව යුතු නොවන්නේ ය.

5.11 ජීවදත්ත මගින් බැංකු සේවා යෙදුමට ප්‍රවේශ වීමේ සේවාව අනිසි ලෙස භාවිතය සම්බන්ධයෙන් බැංකුව විසින් දරනු ලබන සියලු පාඩු සහ හානි සඳහා ගනුදෙනුකරු විසින් බැංකුව හානිපූරණය කළ යුතු ය.

6. ගාස්තු සහ ගෙවීම්

6.1 ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව හරහා කරන ලද ගනුදෙනුවලට අදාළ සියලු ගාස්තු සහ ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව භාවිතා කිරීමට අදාල පහසුකම් සේවා ගාස්තු, නීති ගාස්තු සහ ව්‍යවස්ථාපිත ගාස්තු ඇතුළු වෙනත් ගාස්තු තිබේ නම් එවැනි වෙනත් ගාස්තු බැංකුව විසින් තීරණය කරනු ලබන සහ බැංකුවේ නිල වෙබ් අඩවියෙහි ඇති ගාස්තු අත්පොතේ පල කර තිබෙන පවත්නා අනුප්‍රමාණවලට හෝ අනාගත අනුප්‍රමාණවලට අනුව ප්‍රමාණවත් මුදල් ඇති ගනුදෙනුකරුගේ යම් ගිණුමකින්/ ගිණුම්වලින් හර කර ගැනීමට ගනුදෙනුකරු විසින් බැකුව වෙත මෙයින් බලය ලබාදී සිටිනු ලැබේ.

6.2 නියමිත දිනයේදී ගනුදෙනුකරුගේ ගිණුමෙන්/ගිණුම්වලින් පහසුකම් සේවා ගාස්තුව ආපසු අය කර ගැනීමට නොහැකි වන අවස්ථාවක දී, පසු දිනයකදී ඔහුගේ/ඇයගේ ගිණුම්ලින් පහසුකම් සේවා ගාස්තුව අය කරමින් එම මුදල හර කිරීමට ගනුදෙනුකරු විසින් බැංකුව වෙත මෙයින් බලය ලබා දී සිටිනු ලැබේ. (සැක දුරු කිරීම සඳහා, NEOS Pay පහසුකම භාවිතයෙන් ගනුදෙනුවල යෙදීමේ අරමුණ සඳහාම පමණක් ජංගම බැංකු සේවා යෙදුම භාවිත කරනු ලබන ගනුදෙනුකරුවන් සඳහා මෙම විධිවිධානය අදාළ නොවිය යුතු ය.)

7. පාඩු සහ ප්‍රමාදයන් ආදිය සඳහා වන වගකීම්

7.1 ගනුදෙනුකරු විසින්, ගනුදෙනුකරුගේ දැනුවත්භාවය ඇතිව හෝ නොමැතිව, ගනුදෙනුකරු වෙත නිකුත් කර ඇති හෝ ගනුදෙනුකරු විසින් ආදේශ කරගෙන ඇති පරිශීලක අනන්‍යතාවයන් සහ මුරපදය භාවිත කිරීම හේතුවෙන් දරන ලද හෝ පියවන ලද යම් පාඩුවකින් හෝ වගකීමකින් බැංකුව නිදහස් කළ යුතු ය.

7.2 කවර හෝ හේතුවක් මත ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව මගින් ලබා දී ඇති යම් උපදෙස් පිළිනොගැනීමේ සහ/හෝ පිළිනොපැදීමේ ප්‍රතිඵලයක් වශයෙන්

ගනුදෙනුකරු විසින් දරන ලද හෝ විඳින ලද යම් පාඩුවක්, හානියක් හෝ වගකීමක් සඳහා බැංකුව ගනුදෙනුකරු වෙත වගකියනු නොලැබිය යුතු ය.

7.3 තුන්වන පාර්ශ්වයන් සමඟ පවතින විකුණුම් හෝ සේවා සැපයුම් ගිවිසුම් සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව හරහා කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් වන විට දී, තුන්වන පාර්ශ්වයන් විසින් ඔවුන්ගේ බැඳීම් ඉටු කිරීමේදී ඔවුන්ගෙන් සිදුවන යම් අතපසුවීම්/දෝෂ සම්බන්ධයෙන් බැංකුව කිසිදු ආකාරයකින් ගනුදෙනුකරු වෙත වගකියනු නොලැබිය යුතු බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබිය යුතු ය.

7.4 යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ගනුදෙනුකරු විසින් කරන ලද යම් ගෙවීම් පසුව එළඹෙන වැඩ කරන දිනය අවසන් වන විට යාවත්කාලීන වන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබිය යුතු අතර සේවා සැපයුම්කරුගේ ප්‍රමාදයන් හේතුවෙන් යාවත්කාලීන කිරීම්වල සිදුවන ප්‍රමාදයන් සම්බන්ධයෙන් බැංකුව ගනුදෙනුකරු වෙත වග කියනු නොලැබිය යුතු ය.

7.5 ජංගම උපාංගය සහ/හෝ පෞද්ගලික පරිගණකය නැතිවීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් යම් අවස්ථාවක දී හෝ කලින් කලට නඩු පවරනු ලැබිය හැකි, විඳිනු ලැබිය හැකි, දරනු ලැබිය හැකි, කරනු ලැබිය හැකි හෝ ඉදිරිපත් කරනු ලැබිය හැකි වන්නා වූ (සියලු නීත්‍යානුකූල සහ වෙනත් පිරිවැය, ගාස්තු සහ වියදම් ඇතුළුව) සියලු නඩු, හානි, පාඩු, පිරිවැය, වියදම්, හිමිකම් පෑම්, වගකීම් හෝ ඉල්ලීම් සම්බන්ධයෙන් අවංගු කළ නොහැකි ලෙස ගනුදෙනුකරු විසින් බැංකුව හානිපූරණය කරනු ලැබිය යුතු ය.

8. බැංකුවේ වගකීම්

8.1 ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවා හා සම්බන්ධ බැංකුවේ පද්ධති වලට, බැංකුව වෙත කලින් කලට අදාළ විය හැකි යම් නීති, රීති, නියෝග, මාර්ගෝපදේශ, චක්‍රලේඛ, ආචාරධර්ම සංග්‍රහ සහ පවත්නා වෙළඳපොළ පරිචයන් සැලකිල්ලට ගෙන පද්ධතිය ක්‍රියාකරවීමේදී ඇතිවන අවදානම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂණ සැලසුම් සහ පාලනක්‍රම ඇති බව සහතික කිරීම සඳහා බැංකුව විසින් සාධාරණ පියවර ගනු ඇති බව ග නුදෙනුකරු විසින් පිළිගනු ලැබේ.

8.2 කිසිදු අවස්ථාවකදී, බැංකුව හෝ යම් සේවා සැපයුම්කරුවකු විසින්, ආදායම, ලාභ හෝ ඉතිරිකිරීම්වල යම් අහිමිවීමක් ඇතුළුව එහෙත් ඊට සීමා නොවන යම් ආනුෂංගික, වක්‍ර, විශේෂ, අනුගාමීව සිදුවන හෝ ආදර්ශ හානි සම්බන්ධයෙන් ගනුදෙනුකරු වෙත වගකිවයුතු නොවන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

8.3 බැංකුව විසින් අදාළ නීති හා නියෝග ප්‍රකාරව යම් සැක කටයුතු සහ නියම කරන ලද සීමාවෙන් ඉහළ ගනුදෙනු ශ්‍රී ලංකා මහබැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකාවේ පවත්නා යම් නීති හෝ නියෝගවලට අනුකූලව බැංකුව විසින් ගනු ලබන යම් ක්‍රියාමාර්ගයක් සඳහා බැංකුව වගකියනු නොලැබිය යුතුය. එසේ වුව ද, අවසරලත් සීමාවෙන් ඉහළ වන යම් ගනුදෙනුවක් බැංකුව විසින් ස්වයංක්‍රීයවම අවහිර කරනු ලැබිය යුතු ය.

8.4 බැංකුවේ බරපතල නොසැලකිල්ල හෝ සිතාමතාම පැහැර හැරීම හේතුවෙන් මිස;

(i) ගනුදෙනුකරු හෝ බලය පැවරී ඇති හෝ නොමැති වෙනත් යම් තැනැත්තකු විසින් ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව යන සේවාවන් භාවිත කිරීම සහ/හෝ එසේ භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යම් තොරතුරු වෙත ප්‍රවේශ වීම,

(ii) යම් සන්නිවේදන ජාලයක් අකර්මණ්‍ය වීම, තුන්වන පාර්ශ්වයේ යම් සේවා සැපයුම්කරුවන් විසින් කරනු ලබන ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, උපකරණයේ කාර්මික දෝෂයක්, විදුලි බල ඇණ හිටීමක්, ක්‍රමවත්ව ක්‍රියා නොකිරීමක්, බිඳවැටීමක් හෝ අප්‍රමාණවත් බවක්, සවිකිරීම හෝ පහසුකම් හෝ (නීතියේ බලය ඇතිව හෝ නොමැතිව) යම් නීති, රීති, නියෝග, සංග්‍රහ, විධාන, නියාමන මාර්ගෝපදේශ හෝ රජයේ මඟ පෙන්වීම් ඇතුළුව එහෙත් සීමා කිරීමකින් තොරව, බැංකුවේ සාධාරණ පාලනයෙන් තොර වූ යම් ක්‍රියාවන්, නොකර හැරීම හෝ අවස්ථානුගත කරුණු හේතුවෙන්, ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව යන සේවා සැපයීමේ, එම සේවාවට අදාළ උපදෙස් හෝ තොරතුරු සම්ප්‍රේෂනය කිරීමේ හෝ අන්තර්ජාල අඩවිය (අඩවි) සමග සම්බන්ධවීමේ යම් තොරතුරු, අන්තර් නිරෝධනයක්, අත්හිටුවීමක්, ප්‍රමාදයක්, අහිමිවීමක්, නොපැවතීමත්, විකෘති වීමක් හෝ වෙනත් අපොහොසත් වීමක්, සහ

(iii) ගනුදෙනුකරුට, ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවා භාවිත කිරීමට අදාළව ගනුදෙනුකරු විසින් මෙහෙයවනු ලබන සේවාවලට සහ/හෝ ගනුදෙනුවලට හෝ කටයුතුවලට අදාළ යම් තොරතුරු සහ/හෝ ගනුදෙනු යම් සන්නිවේදන ජාල සැපයුම්කරුවකුගේ යම් පද්ධතියක්, උපකරණයක් හෝ සාධන පත්‍රයක් හරහා හෝ එවැන්නක් තුළ සම්ප්‍රේෂනය කිරීම සහ/හෝ ගබඩා කිරීම.

මගින් හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන ප්‍රතිවිපාක සඳහා බැංකුව හෝ එහි යම් සේවා නියුක්තයකු ගනුදෙනුකරු වෙත යම් වගකීමකට හෝ බැඳීමකට යටත් නොවිය යුතු ය.

9. ගනුදෙනුකරුගේ වගකීම්

9.1 ගනුදෙනුකරු හෝ බලය පැවරී ඇති හෝ නොමැති වෙනත් යම් තැනැත්තකු විසින් ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව යන සේවාවන් වෙත ලියාපදිංචි වීම, ප්‍රවේශ වීම සහ භාවිත කිරීම සහ/හෝ එකී භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යම් තොරතුරු හෝ වාර්තා හෝ වෙනත් යම් තොරතුරු පරිශීලනය කිරීම මගින් හෝ ඒ සම්බන්ධයෙන් ඇතිවන සියලු ප්‍රතිවිපාක සඳහා ගනුදෙනුකරු පූර්ණ වශයෙන්ම වගකීමට යටත් විය යුතු සහ වගකිව යුතු වන අතර, සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් අතරින් යම් අයෙකු විසින් දරනු ලැබිය හැකි කවර හෝ ආකාරයක සියලු වගකීම්, හිමිකම් පෑම්, ඉල්ලීම්, නඩු, හානි, මුදල්, ගාස්තු සහ වියදම් සම්බන්ධයෙන් ද, ඒ සම්බන්ධව සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් අතරින් යම් අයකු විසින් හෝ යම් අයකුට එරෙහිව පවරනු ලැබිය හැකි සියලු නඩු හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් ද ගනුදෙනුකරු විසින් එකී සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් හානිපූරණය කරනු ලැබිය යුතු ය.

9.2 3.6 වගන්තියට යටත්ව බැංකුවේ හෝ එහි සේවා නියුක්තයන්ගේ බරපතළ නොසැලකිල්ල හෝ හිතාමතාම පැහැර හැරීම හේතුවෙන් අතපසු වීමෙන් කරන ලද හෝ වැරදි ලෙස යොමු කරන ලද ගෙවීමක ප්‍රතිඵලයක් ලෙස ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව යන සේවා භාවිතයෙන් සිදු කරන ලද අනවසර ගනුදෙනු හේතුවෙන් සිදුවන මුදල් පාඩුවක් හෝ අස්ථානගත වීමක් සඳහා ගනුදෙනුකරු විසින් වගකියනු නොලැබිය යුතු ය.

9.3 බැංකුවේ හෝ එහි සේවා නියුක්තයන්ගේ පාර්ශ්වයෙන් කිසිදු බරපතල නොසැලකිල්ලක්, වංචාවක් හෝ හිතාමතාම පැහැර හැරීමක් සිදුව නොමැති අවස්ථාවක දී, ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව යන සේවාවන් සැපයීම, හෝ ඒ යටතේ සපයන ලද යම් තොරතුරු හෝ වාර්තාවක්/වාර්තා හෝ මෙම නියම හා කොන්දේසි යටතේ බැංකුවේ බලතල සහ අයිතීන් ක්‍රියාත්මක කිරීමේදී හෝ ආරක්ෂා කිරීමේදී, බැංකුව, එහි සේවා නියුක්තයන් හෝ සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් විසින් දරනු ලැබිය හැකි කවර හෝ ආකාරයක සියලු වගකීම්, හිමිකම් පෑම්, පාඩු, හානි, මුදල්, ගාස්තු සහ වියදම් සම්බන්ධයෙන්ද ඔවුන්ගෙන් යම් අයකු විසින් හෝ යම් අයකුට එරෙහිව පනවනු ලබන සියලු නඩු හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් ද ගනුදෙනුකරු විසින් එකී බැංකුව, එහි සේවා නියුක්තයන් හෝ සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ අදාළ නිලධරයන් සහ සේවා නියුක්තයන් හානිපූරණය කළ යුතු ය.

9.4 යම් ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් තුළ එනම් උදාහරණයක් ලෙස පුද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනයන්, සමාජ ජාලා ආදියෙහි භාවිත කරනු ලබන පොදු පරිශීලක අනන්‍යතාවයන් සහ මුරපද යොදා ගනිමින් ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව යන සේවාවන් භාවිත කිරීම හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ගනුදෙනුකරු පූර්ණ වශයෙන්ම දැනුවත්ව සිටින බවටත් එවැනි අවස්ථාවන් වැළැක්වීම සඳහා නිසි පූර්ව ආරක්ෂණ ක්‍රියාමාර්ග ගනු ලබන බවටත් යම් පරිශීලක අනන්‍යතා/මුරපද සොරකම් සම්බන්ධයෙන් බැංකුව වගකීමට යටත් නොකරන බවටත් ගනුදෙනුකරු විසින් එකඟව, පිළිගනු ලැබේ.

10. නියම හා කොන්දේසි වෙනස් කිරීම

10.1 මෙම නියම හා කොන්දේසි වලින් කිසිවක්, ගනුදෙනුකරුට දැන්වීමක් ලබාදී ස්වකීය පරම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක සංශෝධනය කිරීමට, ඒවාට යමක් එකතු කිරීමට හෝ වෙනස් කිරීමට බැංකුව හිමිකම් ලැබිය යුතු බවටත් එම සංශෝධනය, එකතු කිරීම හෝ වෙනස් කිරීම මගින් ගනුදෙනුකරු බැඳී සිටිය යුතු වන බවටත් ගනුදෙනුකරු මෙයින් එකඟව සිටියි. නියම හා කොන්දේසි වල යාවත්කාල කරන ලද අනුවාදය හෝ අනුවාද බැංකුවේ නිල වෙබ් අඩවියෙහි පල කිරීම මගින් SMS පණිවුඩයක් හරහා ගනුදෙනුකරුට දැනුම් දිය යුතුය.

10.2 ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව යන සේවාවන් භාවිත කිරීම සමග සම්බන්ධිත වරප්‍රසාද බැංකුව විසින් නිශ්චය කළ යුතු අතර, කලින් කලට බැංකුව විසින් යෝග්‍ය යයි සලකනු ලබන පරිදි, සේවාව සමග සම්බන්ධිත මෙම වරප්‍රසාද සහ කොන්දේසි වෙනස් කිරීමට, මද වශයෙන් වෙනස් කිරීමට, ඒවාට යමක් එකතු කිරීමට හෝ සංශෝධනය කිරීමට බැංකුවට පරම අභිමතය තිබිය යුතුය.

10.3 ජංගම බැංකු සේවා සහ/හෝ මාර්ගගත බැංකු සේවා බැංකුවේ සාංගමික සංස්ථා පත්‍රය සහ සංගමික ව්‍යවස්ථාවලිය, රීති සහ නියෝග, මෙම නියම හා කොන්දේසි සහ ජංගම බැංකු සේවාව මගින් ආවරණය වන සේවාවන්, පහසුකම් සහ ගනුදෙනු පාලනය කරනු ලබන බැංකුවේ වෙනත් නියම හා කොන්දේසි යනාදියට යටත් විය යුතු ය.

10.4 පෞද්ගලික ගිණුම් පාලනය කරනු ලබන බැංකුවේ නියම හා කොන්දේසි මින්පසු ජංගම බැංකු සේවා සහ/හෝ මාර්ගගත බැංකු සේවා හරහා විවෘත කරනු ලබන යම් ස්ථාවර තැන්පතු ගිණුම් සම්බන්ධයෙන් ගනුදෙනුකරුවන්ට අදාළ විය යුතු අතර එම නියම හා කොන්දේසි මගින් ගනුදෙනුකරුවන් බැඳී සිටිය යුතු ය.

11. අවසන් කිරීම

11.1 ගනුදෙනුකරු විසින් ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව භාවිත කිරීම අවසන් කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවකදී ගනුදෙනුකරු 0094 112448888 අංකයෙන් බැංකුවේ පැය 24ම ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථාන ඇමතිය යුතු ය. බැංකුව විසින් ගනුදෙනුකරුට පෙර දැනුම්දීමක් සහිතව බැංකුවේ පූර්ණ අභිමතය පරිදි ගනුදෙනුකරුගේ පරිශීලක අනන්‍යතාවය අක්‍රිය කිරීම, ගනුදෙනුකරුගේ ප්‍රොෆයිලය මකාදැමීම සහ/හෝ ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව අවලංගු කිරීම, ඉවත් කර ගැනීම හෝ අලුත් කිරීම කළ යුතුය.

11.2 පහත දැක්වෙන අවස්ථාවලදී ජංගම බැංකු සේවාවෙන් සහ/හෝ මාර්ගගත බැංකු සේවාවෙන් ගනුදෙනුකරුගේ පරිශීලක අනන්‍යතාවය අක්‍රීය කිරීම සහ ගනුදෙනුකරුගේ ප්‍රොෆයිලය මකාදැමීම සඳහා වන අයිතිය බැංකුව සතුවන බවට ගනුදෙනුකරු විසින් අවබෝධ කරගනු ලැබිය යුතුය:-

(i) බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රකාරව අඛණ්ඩ කාලසීමාවක් සඳහා ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව භාවිත කර නොමැති අවස්ථාවකදී;

(ii) බැංකුව විසින් තීරණය කරනු ලබන අඛණ්ඩ කාල සීමාවක් සඳහා පහසුකම් සේවා ගාස්තුව ගෙවා නොමැති/බැංකුව විසින් පහසුකම් සේවා ගාස්තුව ආපසු අය කර ගැනීම සඳහා ගිණුම්වල ප්‍රමාණවත් මුදල් නොමැති අවස්ථාවකදී, (සැකදුරු කිරීම සඳහා NEOS Pay පහසුකම භාවිතයෙන් ගනුදෙනුවල යෙදීමේ අරමුණු සඳහාම පමණක් ජංගම බැංකු සේවා යෙදුම භාවිත කරනු ලබන ගනුදෙනුකරුවන් සඳහා මෙම විධානය අදාළ නොවිය යුතු ය.)

12. පාලනය වන්නා වූ නීතිය සහ අධිකරණ බලය

12.1 සේවාවන් සහ මෙම නියම හා කොන්දේසි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති මගින් පාලනය විය යුතු අතර එම නීති ප්‍රකාරව අවබෝධ කරගනු ලැබිය යුතු ය.

12.2 බැංකුව සහ ගනුදෙනුකරු විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අධිකරණවල අනන්‍ය අධිකරණ බලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

13. විමසීම්, පැමිණිලි සහ ආරවුල් නිරවුල්කරණය කිරීම

13.1 ජංගම බැංකු සේවාව සහ/හෝ මාර්ගගත බැංකු සේවාව භාවිත කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරුට යම් පැමිණිල්ලක් හෝ විමසීමක් ඇති අවස්ථාවක දී, ගනුදෙනුකරු විසින් 0094 112 448888 යන අංකයෙන් බැංකුවේ පැය 24ම ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානය ඇමතිය යුතු ය. නැතහොත් බැංකු ශාඛාවකට පිවිසිය යුතු ය. පැමිණිල්ල නොවිසඳුණු අවස්ථාවකදී ගනුදෙනුකරු විසින් මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා හෝ ශ්‍රී ලංකා මහබැංකුව මගින් පිළිසරණ ඉල්ලා සිටිය හැකි ය.

13.2 ගනුදෙනුකරුට දැනගැනීමට ලැබුණු ගනුදෙනුවල සිදුවූ යම් දෝෂයක්, විෂමතාවක් හෝ නොකර හැරීමක් පිළිබඳව ගනුදෙනුකරු විසින් ප්‍රකාශයේ දින සිට දින 14ක් ඇතුළත බැංකුවට දැනුම් දෙනු ලැබිය යුතු ය.

14. NEOS Pay පහසුකම

14.1 NEOS Pay පහසුකම භාවිතයෙන් ජංගම බැංකු සේවා යෙදුම හරහා සිදුකරනු ලබන ගනුදෙනු සඳහා බැංකුව වගකියනු නොලබන බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

14.2 ගනුදෙනුකරු විසින් NEOS Pay පහසුකම සඳහා ලියාපදිංචි වන වෙනත් මූල්‍ය ආයතනවල ඇති එක් එක් ගිණුම් සම්බන්ධයෙන් SMS නිවේදන පහසුකමක් සඳහා ඔහු/ඇය ලියාපදිංචි වී ඇති බවට ගනුදෙනුකරු විසින් සහතික විය යුතු ය.

14.3 වෙළෙන්දන් විසින් සපයනු ලබන QR කේතය මගින් ව්‍යුත්පන්න වන තොරතුරුවල නිරවද්‍යතාව සම්බන්ධයෙන් බැංකුවට කිසිදු බැඳීමක් හෝ වගකීමක් නොමැති බවට ගනුදෙනුකරු විසින් තවදුරටත් එකඟව පිළිගනු ලැබේ.

14.4 අදාල මූල්‍ය ආයතනයේ ලියාපදිංචි කරන ලද ජංගම දුරකතන අංකයට උත්පාදනය කර යවන ලද අහඹු අංකය වෙනත් තුන්වන පාර්ශවයක් සමඟ බෙදා ගැනීමෙන් තොරව ආරක්ෂිතව සහ ආරක්ෂා කර තබා ගැනීමට අවශ්‍ය පූර්වාරක්ෂණ පියවර ගනුදෙනුකරු විසින් ගනු ලැබිය යුතු ය.

14.5 NEOS Pay පහසුකමට අදාළ යම් පැමිණිලි මෙහි 13 වන අයිතම අංකයේ විස්තරාත්මකව දක්වා ඇති පැමිණිලි කාර්ය පටිපාටියට අනුව හසුරුවනු ලැබිය යුතු බවට ගනුදෙනුකරු විසින් එකඟව සිටිනු ලැබේ.

15. ගනුදෙනුකරුගේ ප්‍රකාශය

15.1 (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය** විසින් මා හට ජංගම/මාර්ගගත බැංකු සේවා පහසුකම ලබාදෙන ලෙස වන මාගේ ඉල්ලීම පිළිගැනීමට එකඟවීම සැලකිල්ලට ගනිමින්, මෙම නියම හා කොන්දේසි මා විසින් පැහැදිලි කරගෙන, අවබෝධ කරගෙන, පිළිගත්තා ලද බවට මෙයින් එකඟව සිටිනු ලැබේ. බැංකුවේ ජංගම/මාර්ගගත බැංකු සේවා පාලනය වන්නාවූ සියලු නියම හා කොන්දේසිවලින් බැඳී සිටීමට මා විසින් එකඟව සිටිනු ලැබේ. බැංකුව

විසින් ලබා දෙන ලද ආරක්ෂක සහ ආරක්ෂණ උපදෙස්වලට අනුකූලව මා කටයුතු නොකළහොත්, සිදුවන අවදානම සම්පූර්ණයෙන්ම මා විසින් භාරගත යුතු බවට මම ප්‍රකාශ කර සිටිමි. තව ද, බැංකුව විසින් මාගේ ඉල්ලීම පිළිගැනීම සම්බන්ධයෙන් හෝ එසේ කිරීමෙන් හටගන්නා සියලු නඩුකර, කාර්යපටිපාටින්, වගකීම්, හිමිකම්පෑම්, නඩු, අලාභ, පිරිවැය සහ වියදම්වලට එරෙහිව බැංකුව හානිපූරණය කර තැබීමට මා විසින් එකඟව සිටිනු ලැබේ. යම් තැනැත්තකු විසින් පරිශීලක අනන්‍යතාවය සහ මුරපදය අනවසරයෙන් භාවිත කිරීමක් හෝ අනවසරයෙන් භාවිත කිරීමට උත්සාහ දැරීමක් පිළිබඳව හෝ තෙවන පාර්ශ්වයක ජීවදත්ත මගින් ජංගම බැංකු සේවා යෙදුමට අනවසරයෙන් ප්‍රවේශ වීමක් හෝ ප්‍රවේශ වීමට උත්සාහ දැරීමක් පිළිබඳව මා හට දැනගැනීමට ලැබුණහොත් ඒ පිළිබඳව මා විසින් වහාම බැංකුව වෙත දැනුම් දිය යුතු බවට මම සහතික කර සිටිමි.

15.2 වෙනත් බැංකුවලින්, ණය තොරතුරු කාර්යාංශයෙන් (CRIB) හෝ ගිණුම (ගිණුම්) සම්බන්ධ තොරතුරු ලබාගැනීම සඳහා නීත්‍යානුකූලව බලය පැවරී ඇති වෙනත් යම් අධිකාරියකින් ලැබෙන යම් සහ සියලු විමසීම් සඳහා මාගෙන් විමසීමෙන් තොරව, බැංකුව විසින් තීරණය කරන ආකාරයකට ප්‍රතිචාර දැක්වීමට සහ සැලසීමට මා විසින් බැංකුව වෙත බලය පවරා සිටිනු ලැබේ. සැක දුරු කිරීම සඳහා එවැනි ප්‍රතිචාරයක බැංකු යොමුවක් ඇතුළත් කළ හැකි ය.

15.3 ජංගම බැංකු සේවාව සම්බන්ධයෙන් වන ඉහත සඳහන් නියම හා කොන්දේසි මා විසින් කියවා, අවබෝධ කරගෙන, ඒවායින් බැඳී සිටීමට එකග වන බවට මා විසින් මෙයින් සහතික කර සිටිනු ලැබේ.

තනි ගනුදෙනුකරු

....

නම ජා.හැ.අංකය

....

අත්සන දිනය